Student/Registration Number | | | | | | | | | | | | Centre Number | | | | | | |

## 2012 Public Examination

# Sinhala

## Continuers Level

**Tuesday 16 October: 2 p.m. Eastern Standard Time**

Reading Time: 10 minutes
Working Time: 2 hours and 50 minutes

- *You have 10 minutes to read all the papers and to familiarise yourself with the requirements of the questions. You must not write during this time.*
- *Monolingual and/or bilingual printed dictionaries may be consulted during the reading time and also during the examination.*

## Section 1: Listening and Responding (30 marks)

**Instructions to Students**

1. Allow approximately 50 minutes for Section 1.
2. Write all your answers to the questions in Section 1 in this booklet in blue or black ink or ball-point pen. Space is provided for you to make notes.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

*© Victorian Curriculum and Assessment Authority 2012*

www.theallpapers.com

**Part A** (Questions 1–4)
(20 marks)

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and specific aspects of texts by identifying and analysing information and convey the information accurately and appropriately.*

You will hear FOUR texts. Each text will be played twice. There will be a short break between the first and second playings in which you may make notes.

Listen carefully to each text and then answer the questions in ENGLISH.

**Marks**

You may make notes in this space.

**Text 1**

1. What information did Lal give to Mali and what was Mali's reaction to this information? **2**



www.theallpapers.com

**Marks**

You may make notes in this space.

**Text 2**

2. What are **four** main messages in this announcement? **4**





www.theallpapers.com

Marks | You may make notes in this space.

**Text 3**

3. (a) Use statistical evidence from the news item to justify the statement that 'Kumar Sangakkara is an outstanding cricket player'. **1**

(b) Identify **four** ways in which the news item states that Kumar Sangakkara has been recognised for his achievements and skill as a cricketer. **4**



www.theallpapers.com

Marks | You may make notes in this space.

**Text 4**

4. (a) What project is being discussed? **1**

(b) Identify one positive and one negative aspect of the counting process. **2**

(c) What was Ruwan's final judgment about the project's processes? Explain your answer. **2**

(d) According to Ruwan, what issue has become a major problem? Provide **three** ways in which the project has helped to solve this problem. **4**

issue ______________________

ways in which the project has helped



www.theallpapers.com

**Part B** (Questions 5–6)
(10 marks)

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and specific aspects of texts by identifying and analysing information;*
- *convey the information accurately and appropriately.*

You will hear TWO texts, one relating to Question 5 and one relating to Question 6. Each text will be played twice. There will be a short break between the first and second playings in which you may make notes.

Listen carefully to each text and then answer the questions in SINHALA.

**Marks** | You may make notes in this space.

**Text 5**

5. (a) What did the group win and why did this achievement bring such great honour to Sri Lanka? **2**

මෙම කණ්ඩායම විසින් ලබා ඇති ජයග්‍රහණය කුමක්ද සහ මෙය ශ්‍රී ලංකාවට විශාල ගෞරවයක් වන්නේ මන්ද?

(b) Apart from the items presented, what other factors made this achievement possible? **2**

එම කණ්ඩායම විසින් ඉදිරිපත් කළ අංග හැරුණු විට, මෙම ජයග්‍රණයට හේතු වු අනෙකුත් කරුණු මොනවා ද?



www.theallpapers.com

Marks

You may make notes in this space.

**Text 6**

6. Explain the importance of the lakes to this village. **6**

   මෙම ගමට වැව් වලින් ඇති වැදගත්කම විස්තර කරන්න.

**End of Section 1**



www.theallpapers.com

Student/Registration Number | | | | | | | | | | | | Centre Number | | | | | | |

# 2012 Public Examination

# Sinhala
## Continuers Level

## Section 2: Reading and Responding (30 marks)

**Instructions to Students**

1. Allow approximately 1 hour and 15 minutes for Section 2.
2. Write all your answers to the questions in Section 2 in this booklet in blue or black ink or ball-point pen.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

© Victorian Curriculum and Assessment Authority 2012

www.theallpapers.com

**Part A** (Questions 7–8)
(20 marks)

---

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and/or specific aspects of texts, by, for example, comparing, contrasting, summarising, or evaluating, and convey the information accurately and appropriately.*

---

7. Read the text and then answer in ENGLISH the questions that follow.

**අනාගත අර්බුදය**

දැනට ලෝක ජනගහනය බිලියන 7 කි. මිලියන 80 ක් පමණ එයට වාර්ෂිකව එකතුවේ. 2050 වසර වන විට ලෝක ජනගහනය බිලියන 8 ක් පමණ වේ යැයි ගණන් බලා ඇත.

මෙසේ වර්ධනය වෙමින් පවතින ලෝක ජනගහනයට අනාගතයේදී ආහාර සැපයීම විශාල අභියෝගයක් වී ඇත.

'නිව් සයන්ටිස්ට්' සඟරාවට අනුව දැනටමත් ලෝක ආහාර අර්බුදය ඇරඹී ඇත. නැගෙනහිර අප්‍රිකාවේ විශාල සාගතයකි. විවිධ හේතූන් නිසා ආහාර නිෂ්පාදනය ද අඩුවී ඇත. උදාහරණ වශයෙන් වර්තමානයේ පවතින දේශගුණික විපර්යාස නිසා වගා පාළු වී, අස්වනු අඩු වී ඇත. තවද, කිරි සහ මස් සඳහා වැඩිවෙමින් පවත්නා ඉල්ලුම සැපයීම සඳහා වගා බිම්වලින් කොටසක් සත්ව ආහාර නිපදවීමට යොදා ගෙන තිබේ.

2011 වසරේදී ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 21 කි. ශ්‍රී ලංකා රජය අනාගත ආහාර අර්බුදයට මුහුණ දීමට සූදානමින්, අවශ්‍ය පියවර ගනිමින් සිටියි. පසු ගිය යල කන්නයෙන් ලැබූ යෝධ වී අස්වැන්න සුරක්ෂිතව ගබඩා කර තැබීමට තීරණය කෙරුණි. ඒ සඳහා අවශ්‍ය පහසුකම් ද පුළුල් කෙරුණි. පලතුරු සහ එළවළු වැඩි එලදාව කල් තබා ගැනීම සඳහා, ටින් කිරීමට සහ විජලනය කිරීමට අවශ්‍ය ආධාර හා උපදෙස් ලබා දී ඇත. වැව් සහ ඇළ ප්‍රතිසංස්කරණය කර, පුරන් වී ගිය කුඹුරු වගා කිරීමට සලස්වා ඇත. පොල් වතු සහ කුඹුරු කැබලි කර විකිණීමත්, කොස් හා පොල් ගස් කැපීමත්, තහනම් කිරීම ප්‍රකාශයට පත් කර ඇත. විසිතුරු මල් පැළ වෙනුවට, ගෙවතුවල පලතුරු සහ එළවලු වගා කිරීමට උනන්දු කිරීම සඳහා, පැළ සහ බීජ වර්ග ද අවශ්‍ය උපදෙස් ද මහජනයාට නොමිලේ සපයා දී ඇත. මීට අමතරව මිරිදිය මාලු බෝකිරීම මගින් ධීවර කර්මාන්තය වර්ධනය කිරීමට ද, පියවර ගෙන ඇත.

පරිසර හිතකාමී ගොවිතැන අළුත්ම පෙරළියයි. මෙහිදි මිනිසාටත් පරිසරයටත් අහිතකර කෘත්‍රිම පොහොර වෙනුවට ශාක කොටස් සහ ගොම වැනි ද්‍රව්‍ය භාවිතා කරන සම්ප්‍රදායික ක්‍රම යොදා ගෙන ඇත. ලෝකයේ අනෙකුත් රටවල් ද අනාගත අර්බුදය පිළිබඳව සැලකිළිමත් වෙමින්, වහා ක්‍රියාත්මක වීමට කාලය එළඹී ඇත.



www.theallpapers.com

QUESTIONS

**Marks**

(a) According to the text, what is the serious crisis that the world has to face in the future? **1**

(b) Provide evidence to support *The New Scientist* magazine's statement that this crisis has already begun and explain the reasons for this. **3**

evidence

reasons

(c) Explain how the steps taken by the Sri Lankan Government will help to reduce the impact of the future crisis in Sri Lanka. **6**





www.theallpapers.com

8. Read the text and then answer in ENGLISH the questions that follow.

## මාර්ග සංවර්ධනය

### නාමල් ජයවර්ධන

ශ්‍රී ලංකාව ශීඝ්‍රයෙන් දියුණු වන රටකි. සංවර්ධන ක්‍රියාදාමයේ යටිතල පහසුකම් සැපයීමට ගමනාගමනය අත්‍යාවශ්‍ය සාධකයකි. කෙටි කාලයකදී වැඩි දුරක් යෑමෙන් ආර්ථික වාසි අත්වේ. අවශ්‍ය භාණ්ඩ ඉක්මනින් ප්‍රවාහනය කිරීමෙන්, සිදුවෙමින් පවතින සංවර්ධන ක්‍රියාවලියන් ඉක්මන් වනවා පමණක් නොව, අපතේ යෑම් ද අවම වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගර දෙකක් වන, මහනුවර සහ මාතර, අගනුවර වන කොළඹටත්, අනතුරුව කොළඹ නගරය කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළටත් සම්බන්ධ කරමින් අධිවේගී මාර්ග 3 ක් ඉදි වේ. වැඩි වශයෙන්ම මගීන් සහ භාණ්ඩ ප්‍රවාහනය සිදුවන්නේ මෙම නගර හරහාය.

කොට්ටාව - මාතර අධිවේගී මාර්ගය මුලින්ම මෙම මාර්ග පද්ධතියට එක් විය.

මෙම මාර්ගයේ උපරිම වේගය පැයට කිලෝ මීටර් 100 ක් වන අතර වාහනයේ විශාලත්වය අනුව අය කරන ගාස්තුව රුපියල් 400 සිට 2000 දක්වා වෙනස් වේ.

වාහන තදබදයකින් තොරව රිය පැදවීමට හැකි බැවින් ප්‍රමාදය අවම වන අතර, ඉන්ධන පිරිමැස්මක් ද සිදුවේ. සංචාරකයින්ට බෙන්තර, හික්කඩුව වැනි ස්ථාන කරා ගමන් කළ හැකි බැවින්, ඔවුහු මේ මාර්ගය බෙහෙවින් ප්‍රයෝජනයට ගනිති. එය විශාල ආදායමක් ද ඉපයීමට උපකාරවී ඇත. දකුණේ කෘෂි සහ ධීවර නිෂ්පාදන ඉක්මනින්, නැවුම් ලෙස අගනුවරට ප්‍රවාහනය කිරීම ජාතික ආර්ථිකයට රුකුළක් වේ.

මේ අධිවේගී මාර්ගය ඉදි කිරීමේ දී පරිසරහිතවාදීන් තරමක් නොසංසුන් වූහ. ගංගා ආශ්‍රිත පරිසරයට හානි සිදුවිය හැකි බවත්, පාර දෙපස බැමි නිසා වැසි කාලයේදී ගිං ගඟ ආශ්‍රිත ප්‍රදේශ ජලයෙන් යට වී, දේපළ හා වගාවලට හානිවිය හැකි බවත්, ඔවුහු ප්‍රකාශ කළහ. ත්‍රිරෝද රථ, පාපැදි සහ අත් ට්‍රැක්ටරවලට මෙම මාර්ගය තහනම් කිරීම නිසා රජයෙන් වැය කළ ප්‍රාග්ධනය සාමාන්‍ය ජනතාවට ප්‍රයෝජනවත් නොවන බවට තර්ක ඉදිරිපත් විය. මාර්ගය ඉදිවීමත් සමඟ සමහර ගම් බිම් දෙකඩ වීම නිසා ජාතික සහ ආගමික සංහිඳියාව පළුදු වී, ගැටලු ඇතිවීමේ අවස්ථාවක් ඇතිවිය හැකි බවට මත ඉදිරිපත් විය.

මෙම මතවාද පැවතුන ද, අධිවේගී මාර්ගය ජනතාව අතර ඉතා ජනප්‍රිය වී ඇත.



www.theallpapers.com

QUESTIONS

**Marks**

(a) Explain why the writer thinks that freeways are essential to Sri Lanka. **2**

(b) Explain how the development of future freeways has been used to support the argument in part (a). **2**

(c) 'Freeways provide support for the economy of a country, but they do not serve everybody equally.' Justify this statement with evidence from the text. **6**



www.theallpapers.com

**Part B** (Question 9)
(10 marks)

---

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and specific aspects of a text by identifying, analysing, and responding to information;*
- *convey information coherently (structure, sequence, accuracy and variety of vocabulary and sentence structure) and appropriately (relevance, use of conventions of the text type).*

---

9. Read the text and then answer the question in 150–200 words in SINHALA on page 7.

ඔබත් සමඟ එකට ගමේ උගත් කමල්, වසර 5 කට පසු ශ්‍රී ලංකාවට ගියේය. ඔහු තම ගම බැලීමට ගිය ගමන පිළිබඳව, දින පොතේ මෙසේ සටහන් කළේය.

‘ගම දැන් හුඟක් දියුණු වෙලා. පාරවල් හොඳට හදලා. නගරයට යන්න බස් රථයක් විනාඩි 40 කට වරක් එනවා. ගැහැණු, මිනිස්සු තැන් තැන්වල කතා බහ කරමින් ගැවසෙනවා අඩුයි. ඔවුන් බොහොම කළබලෙන් ගමන් කරනවා වගේ තමයි පෙනුනේ.

අප අඹ, වෙරළු ආදිය කැඩීමට නැඟපු ගස් යායම එළි කරලා, කඩ පේළියක් හදලා. ඒවායේ ඇපල් මිදි වැනි රට පලතුරු පිරිලා. පාර අයින්වල සෙල්ලම් කරන ළමුන්ගේ කෑ ගැහිල්ලයි, කුරුල්ලන්ගේ කිචි බිචියයි නැති වුණාට, සාප්පුවලින් එන සිංදු සහ පාරේ වාහනවල නළා හඬවලින් ගමේ පාලුව මැකිලා ගිහින්.

ගමේ පාසැලත් දැන් හුඟක් දියුණුයි. පරිඝනක පහසුකම් පවා තියෙනවා. දැන් පාසැලේ සිසුන් සංඛ්‍යාවත් වැඩිලු. ගමේ අලුතින් බෙහෙත් ශාලාවක් හදලා, බෙහෙත් ගන්න නගරයටම යන්න වුවමනා නැතිලු.

ගමේ හැම ගෙදරකටම විදුලිය ලැබිලා. රාත්‍රියට ගමේ තිබුණ අඳුරු ගතිය මැකිලා ගිහින්. හවසට ළමයින් ඇළේ ඉන්න මාලුයි, කැලෑවේ කුරුල්ලොයි බලමින්, කාලේ ගත කරන්නේ නැහැ. ගෙවල්වලට වෙලා රූපවාහිනිය බලනවා.’

QUESTION

When you asked for information about the village, Kamal gave you his diary entry to read. Write an article in Sinhala, evaluating the information given in Kamal’s diary, under the heading ‘Has our village progressed?’, in 150–200 words for a Sinhalese newspaper published in Australia.

ඔබ ගම ගැන විස්තර ඇසු විට, කමල් දින පොතේ තමා ලියු සටහන කියවීමට දුන්නේය. කමල්ගේ දින පොතේ ඇතුළත් කරුණු ඇගයීමට ලක් කරමින් ‘අපේ ගම දියුණු වෙලා ද?’ යන මාතෘකාව යටතේ, ඕස්ට්‍රේලියාවේ මුද්‍රණය වන සිංහල පුවත් පතකට වචන 150–200 ටත් අතර ලිපියක් සිංහලෙන් ලියන්න.



www.theallpapers.com

*Do not remove this page from the question booklet.*

| Student/Registration Number | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

Sinhala
Continuers Level

| Centre Number | | | | | | |
|---|---|---|---|---|---|---|

Question 9



PLEASE TURN OVER

www.theallpapers.com

**End of Section 2**



www.theallpapers.com

Student/Registration Number | | | | | | | | | | | | Centre Number | | | | | | |

**2012 Public Examination**

# Sinhala

## Continuers Level

## Section 3: Writing in Sinhala (15 marks)

**Instructions to Students**

1. Allow approximately 45 minutes for Section 3.
2. Write your answer to a question from Section 3 in this booklet in blue or black ink or ball-point pen. Space is provided for you to make notes.
3. You must answer ONE question in SINHALA.
4. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
5. All question booklets will be collected at the end of the examination.

© Victorian Curriculum and Assessment Authority 2012

www.theallpapers.com

**Section 3** (Questions 10–13)
(15 marks)

---

*When judging performance in this section, the examiner(s) will take into account the extent to which the student demonstrates:*

- *relevance and depth of treatment of ideas, information, or opinions;*
- *accuracy and range of vocabulary and sentence structures;*
- *the capacity to structure and sequence response and capacity to use conventions of the text type.*

---

Answer ONE question from this section in 200–250 words in SINHALA.

10. ‘Australia is a country that supports and encourages a multicultural society.’ Write an informative report supporting this statement for an educational magazine published in Sri Lanka. Use examples.

    ‘ඕස්ට්‍රේලියාව බහු සංස්කෘතික සමාජයකට උනන්දු කරවන සහ රුකුල් දෙන රටකි.’ මෙම වගන්තිය සනාථ කිරීමට උදාහරණ සහිතව ශ්‍රී ලංකාවේ පළ කරන අධ්‍යාපන සඟරාවකට වාර්තාවක් ලියන්න.

11. ‘Even when people migrate to Australia from Sri Lanka, most Sri Lankan values can be preserved outside the home, both at school and in society.’ Write a script for a speech to be presented at the Multicultural Day celebrations at the Sinhala Language School, expressing your ideas and experience regarding this statement.

    ‘ශ්‍රී ලංකාවේ සිට ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වන අයට, ශ්‍රී ලාංකික වටිනාකම් බොහොමයක්, නිවසෙන් පිට, පාසැලේ සහ සමාජයේ හැසිරෙන විටදී ද, බොහෝ දුරට රැක ගත හැක.’ මේ ප්‍රකාශය පිළිබඳව ඔබේ අදහස් සහ අත්දැකීම් විස්තර කරමින් සිංහල පාසැලේ බහුසංස්කෘතික දින උත්සවයේදී පැවැත්වීමට බලාපොරොත්තු වන කතාවේ පිටපතක් ලියන්න.

12. Write a formal, persuasive letter to your local TV channel asking the manager to show more films and TV programs that are suitable for families to watch together during the weekend. Include in your letter the benefits of providing such entertainment for families.

    සති අන්තයේදී පවුලේ සැමට එක්ව නැරඹීමට සුදුසු චිත්‍රපට සහ රූපවාහිනී වැඩසටහන් ඉදිරිපත් කරවීමට පොළඹවමින් විධිමත් ලිපියක් ප්‍රාදේශීය රූපවාහිනී නාලිකාවක කළමනාකරුට ලියන්න. ඔබේ ලිපියේ, පවුලකට එවැනි විනෝදවීමේ අවස්ථා සැපයීමේ ඇති වැදගත්කම ඇතුළත් කරන්න.

13. Write an imaginative short story about a horse to be published in the children’s section of your local newspaper. Your story will conclude with a moral, a proverb or some good advice for children.

    අශ්වයකු වටා ගෙතුණු මනඃකල්පිත කෙටි කතාවක් ප්‍රාදේශීය පුවත්පතක, ළමා පිටුවේ පළ කිරීම සඳහා ලියන්න. ඔබගේ කතාව ආදර්ශයක් සහිතව හෝ උපහැරණයක් සහිතව හෝ ළමුන්ට යහපත් උපදේශයක් සහිතව අවසන් කරන්න.



www.theallpapers.com

You may make notes in this space.





www.theallpapers.com

Question Number:



www.theallpapers.com

www.theallpapers.com

**End of Section 3**



www.theallpapers.com